# අසනි

සමාජවාදී එක්සත් ලංකාවක් උදෙසා පළවන පුවත් පත

**2023 මැයි- ජූනි**
**51 වන කලාපය.**
**රු. 50/=**

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කරන ලදි


ධනපති පංතියට
විකල්පය ලෙස
**වාමාංශික පෙරමුණ**
**ගොඩනගමු..!**

# ඒකාධිපති වියරුව පරාජය කරමු..!



අරගලයේ මුවාවෙන් ව්‍යවස්ථාවේ කඩතොළු පාවිච්චි කරමින් රටේ මහ පුටුවට පාත්වුනු රනිල්, අරගලය සමයේ කළ කී දෑ සියල්ල අමතක කොට බලහත්කාරයෙන් ඉදිරියට යාමට ගන්නා උත්සාහය පරාජය කළ යුතුය. රනිල් මෙන්ම ඔහුගේ ගෝල බාලයින්ද, පොහොට්ටු බැලයින්ද එක්ව බලයේ රැකෙන්නට සියළු පිඹුරු පත් සකසමින් සිටී. ඒ සඳහා විශේෂයෙන් 'ත්‍රස්ත මර්දන පනත' හකුලාගන්නා බව ලෝකයට කියමින් ඊටත් වඩා දරුණු 'ප්‍රති ත්‍රස්ත පනත' කෙටුම්පත් කර තිබේ.

එහි අන්තර්ගතය කෙතරම් දරුණු දැයි ඕනෑම අයෙකුට අවබෝධ කරගත හැකිය. අද දවසේ අපේ කාර්‍යභාරය වියයුත්තේ රටේ ජනතාවත් සමග කම්කරු පන්ති බලමුළු ගන්වා ආණ්ඩුවේ වියරු උත්සාහය පරාජය කිරීම බව නැවත නැවතත් කිව යුතු නොවෙයි.

පළාත් පාලන ඡන්දය සඟවා ගන්නා ලෙසම, උප්පරවැට්ටි යොදා ජනාධිපතිවරණයද ජනතාවගෙන් උදුරා ගන්නා බව සක්සුදක් සේ පැහැදිලි ය. ජනතා අයිතීන් දිනාගැනීමට පෙරට ආ යුතුය. ▪

## අසනි කව් ගී..

### රතැසියා..!

එදා අත්තනගලු වංශයේ දී
බියට පත්කල රතැසියා ..
යලිත් ආවෙද ගොරක මද වන් ඇස් අයා..
දකිමු රතු එළියක් බිංගය මුවේ..

ඡන්ද සටනට කලින් වියයුතු
යමක් වේ නම් එයද මේ යැයි කියා
වෙළා අත්වැල් සටන් සගයින්
සොය සොයා..
ජන ගඟක් ලෙස ගලා යමු
දෙගම්බඩ තලා..!

## රනිල් ගේ අපේක්ෂාව රාජපක්ෂ හලවා ගැනීමයි..!



ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මත පදනම්ව අර්බුදය සමනය කර ගැනීම ඔහුගේ මූලික අරමුණ වේ. ඒ සදහා පොහොට්ටුව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ගැනීමට ඔවුහු කටයුතු කරමින් සිටි. මෙහි වඩාත් හාස්‍යජනක සිදුවීම වන්නේ දුෂණය, සොරකම, වංචාව නතර කිරීමට ඔවුහු කටයුතු කරන බව ප්‍රකාශ කිරීමය. යහපාලන කාලයේ මහබැංකු බැදුම්කරණයට වගකියන ප්‍රධාන චූදිතයා වුයේ රනිල් වික්‍රමසිංහ බව රට හමුවේ ප්‍රකාශ කළේ රාජපක්ෂලා විසිනි. '..බැංකු හොරා අපට එපා..' යැයි පසුගිය මැතිවරණයේ දී වේදිකා දෙවනක් කළේ ද මෙම පිරිස විසිනි. එම රනිල් වික්‍රමසිංහ මේ වන විට පොහොට්ටුවේ ජනාධිපතිවරයා බවට පත් වී තිබේ.

එහි ප්‍රතිඵලයක් ලෙස අයි.එම්.එෆ් (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල) විසින් යෝජනා කර තිබෙන දුෂණය නතර කර තිබෙන යෝජනා ක්‍රියාවට ගැනීම සඳහා විශේෂ පනතක් පාර්ලිමේන්තතුවට ගෙන ඒමට ඔවුහු කටයුතු කරන බව ප්‍රකාශ කළේ ය. ඒ පනත ඉතිහාසයේ ඇති වු වංචා දූෂණ සෙවීම සඳහා නොව ඉදිරියේ ඇතිවන වංචා දූෂණ සෙවීමට බලපාන පනතක් ලෙස ඉදිරිපත් කරන බවටය. රනිල් වික්‍රමසිංහ රාජපක්ෂ හොරනඩය ආරක්ෂා කිරීම සඳහා අනුගමනය කරන බව වඩාත් හොඳින් මෙමගින් ඔප්පු වී තිබේ.

4 වන පිටුවට



# ‘ අවතාරයක් යුරෝපයේ හොල්මන් කරයි..

## එය නූතන කොමියුනිස්ට් වාදයේ අවතාරයයි..

ප සුගිය මාස කිහිපය පුරාවට සමස්ථ යුරෝපය පුරාම මහ වැඩවර්ජන රැල්ලක් හමා යමින් තිබේ. ඇත්ත වශයෙන්ම මෙම වර්ජන රැල්ලේ කේන්ද්‍රය ප්‍රංශය බව සිතිය හැක. සත්‍ය වශයෙන්ම ජීවන වියදම වැඩිවීම සහ වෘත්තීය අයිතින් කප්පාදුවට එරෙහිව සහ සුභ සාධන කප්පාදුවට එරෙහිව යුරෝපීයන් යුධ ප්‍රකාශ කර ඇත. ආසන්න පසුගිය දින 40 ක කාලයෙන් දින 12 ක් ප්‍රංශයේ වැඩ වර්ජනය කර ඇත. මෙම ලියුම්කරුද මෙම වැඩ වර්ජනයට රාජ්‍ය අංශයේ අධ්‍යාපනික වෘත්තීය සමිති ක්‍රියාකරුවෙකු ලෙස දායකත්වය දී ඇත. මුළු මහත් ප්‍රංශ ජනතාවත් සියළුම වෘත්තීය සමිති සාතිශය බහුතරය ප්‍රංශ ජනපතිගේ නව විශ්‍රාම වැටුප් ප්‍රතිසංස්කරනයට විරුද්ධ වුවත් ඔහු විසින් එය සම්මත කර ගත්තේය. එසේ එය සම්මත කර ගත්තේ ප්‍රංශ ව්‍යවස්ථාවේ 49.3 ප්‍රජාතන්ත්‍ර විරෝධි වගන්තියට නිර්වස්ත්‍රව මුවා වෙමිනි. මේ සම්බන්ධයෙන් ප්‍රංශ පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ගේ ඡන්දය ඔහු විමසුවේ නැත. ප්‍රංශ ජනාධිපති එමානුවෙල් මැක්‍රෝන්ගේ මෙම බොනපාර්ට්වාදී නින්දිත ක්‍රියාවේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රංශ ජනතා නැගිටීම් වල අලුත් ප්‍රවනතා ඇතිවීමට පටන් ගෙන තිබේ. එනම් ස්වයං සිද්ධ බලමුළු ගැන්වීම්, උපාය මාර්ගික අංශ වල වැඩවර්ජන, ප්‍රධාන මාර්ග අවහිර කිරීම්, පාසැල් හා විශ්ව විද්‍යාල වල වාඩිලා ගැනීම්, හමුදා හා පොලිසිය සමග දැඩි වීදි ගැටුම් ඇති වීමේ ඉඩකඩ වැඩි වෙමින් තිබේ.

ප්‍රංශ ජනපතිගේ මෙම හැසිරීම සම්ප්‍රදායක හා රැඩිකල් වෘත්තිය සමිති ව්‍යාපාරයට සහ සංශෝධනවාදි වාමාංශිකයන්ටත් ප්‍රතිසංසකරනවාදි ඊනියා වමටත් දැඩි මානසික ආතතියක් නිර්මාණය කිරීමට සමත් වී ඇත. නිලධාරිවාදි වෘත්තීය සමිති නායකත්වයට තවදුරටත් කල හැකි දෙයක් නැති වන තරමට පීඩනය එල්ල වී ඇත.

මෙසේ ඇති වූ පීඩනයේ ධනාත්මක ප්‍රතිපලයක් ලෙස ප්‍රංශ වැඩකරන ජනතාවගේ සැබෑ නිර්මාණශිලි කණ්ඩායම් අලුත් ක්‍රියා මාර්ග ගැන සාකච්ඡාවන් ආරම්භ කර ඇත. ප්‍රංශය පමණක් නොව සමස්ථ යුරෝපානු කලාපයම ඒකාබද්ධ සටන් කලාපයක් කිරීමේ යෝජනා ඉදිරිපත් වී ඇත. උදාහරණ ලෙස මෙම ලිපිය ලියන 2023 අප්‍රේල් 22 වන දින සවස ප්‍රංශ හා ඉතාලි සමාජවාදි ක්‍රියාධරයන් සටන් ඒකාබද්ධතාවයක් ගැන සාකච්ඡාවක් පැවැත්වීමට නියමිතව ඇත.

අනෙක් අතට මහ බ්‍රිතාන්‍යය පසුගිය අඩ සියවසයේ මුහුණ දුන් විශාලතම වැඩවර්ජන රැල්ලට මුහුණ දෙමින් ඇත. ශ්‍රිසියේ දැනටම මහ වැඩවර්ජන තුනක් සිදු වී ඇත. ජර්මනියේ වසර 30 කට පසු සිදු වූ විශාලතම ප්‍රවාහන හා පොදු සේවක වැඩ වර්ජනය 2023 මාර්තු 27 වන දින සම්පූර්ණයෙන්ම එරට අඩාල කලේය. පසුව එය ජාතික වැඩවර්ජන රැල්ලක් බවට පත්විය. 2008 වර්ෂයෙන් පසුව යුරෝපයේ මෙවැනි මට්ටමක වැඩකරන ජනතාවගේ සටන් තත්වයක් ඇති වී ඇතිද යන්න සැකයකි.

2023 වර්ෂයේ පෙබරවාරි 11 වන දින ලිස්බන් හිදී ගුරුවරුන් 140,000 ක් වැඩ වර්ජනය කර වීදියට බැස්සේය. මෙම ගුරුවරුන් අතර සිටි මරියා ගුයිර්රා පෘතුගාල අගනුවරට 150 Km දුර ලෙයිරියා නගරයේ සිට පැමිණි මහාචාර්ය වරියකි. එහිදී ඇය ප්‍රකාශ කර සිටියේ,

> '..මම මෙහි සිටින්නේ මාගේ සියළුම ශිෂ්‍යයන් වෙනුවෙන් වගේම කෝවිඩ් කාලයේ සිට මේ දක්වා අසරණභාවයට ඇද වැටී ඇති මාගේ සියළුම සගයන් වෙනුවෙන්ය. ඔවුන් දැන් දරුණු උද්ධමනයෙන් පීඩා විදිනවා. පවතින වැටුපෙන් කිසිසේත්ම ජිවත් විමට බැරි තත්වයක් තිබෙන්නේ. ඒ නිසා ඉදිරියේදී වැඩවර්ජන ඉක්මවා ගන සමාජ පෙරලියකට මුලපුරන්න සිදු වෙනවා. ඒ සදහා මම ඔබට ඇරයුම් කරනව..'

2023 පෙබරවාරි 28 වන දින ග්‍රීසියේ ද මිනිසුන් 57 දෙනකුට මරු කැදවූ දුම්රිය ව්‍යවසනයක් සිදු විය. මෙම සිද්ධියෙන් පසුව ග්‍රීසිය පුරා වැඩවර්ජන විරෝධතා ඇති විය. මිය ගිය පිරිසෙන් වැඩි දෙනෙක් කම්කරුවන් සහ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් විය. මේ සම්බන්ධයෙන් ග්‍රිසියේ ප්‍රධාන වෘත්තිය සමිති ප්‍රකාශ කර සිටියේ,

> '..මියගිය හා තුවාල ලැබූ සියළුම දෙනා සම්බන්ධව ඇති වේදනාව කෝපයක් බවට පත්වන බවය..'

එතැන් සිට මාර්තු 8 , 13 හා 16 යන දින වල වැඩවර්ජන 3 ක් කැදවනු ලැබීය. මෙට්‍රෝ සේවකයන් සති 2 ක වැඩ වර්ජනයක් ක්‍රියාත්මක කලේය. ග්‍රීසිය පුරාම දැවැන්ත පෙලපාලි නිර්මාණය විය. එවැනි දැවැන්ත පෙලපලි දක්නට ලැබුනේ 1974 දී ග්‍රීක ඒකාධිපතිවාදය බිද දැමු කාලයෙන් පසුව බව ප්‍රකාශ කෙරේ.

මීලගට ජර්මනියේ උද්ධමන තත්වය නිසා විශාල වැඩ වර්ජන ඇවිලී ඇත. දැන් මාස ගනණාවක සිට රෝහල්, පාසල්, තැපැල් කාර්යාල සහ වරායන් වල වැඩ වර්ජන ඇති වී ඇත. 2023 මාර්තු 27 වන දින ජර්මනියේ ප්‍රවාහන සේවකයන් කල වැඩ වර්ජනය නම් කර තිබුනේ මෙගා වැඩවර්ජනය ලෙසය. පෙබරවාරි මාසයෙදී ජර්මනියේ උද්දමනය 8.7% දක්වා ඉහළ ගියේය. කම්කරුවන් 10.5% ක වැටුප් වැඩිවීමක් ඉල්ලු අතර තත්වය පාලනය කර ගැනීමට පාලකයන් 5% ක වැටුප් වැඩිවිමක් ලබා දෙන ලදී. එසේ වුවද ජර්මනියේ වැඩ කරන ජනතාව මෙය ප්‍රමාණවත් නොවන බව දන්වා ඉදිරි ක්‍රියා මාර්ග සැලසුම් කරමින් තිබේ.

අනෙක් පැත්තෙන් 2023 පෙබරවාරි 01 වන දින මහ බ්‍රිතාන්‍යය අර්බුදය දරුණු තත්වයට පත් විය. එදින දුම්රිය සේවකයන් රාජ්‍ය අංශයේ සේවකයන්,




හෙදියන් ,ගිනි නිවන බටයන් , ගුරුවරුන් සහ විශ්ව විද්‍යාල ආචාර්යවරුන් 500,000 කට අධික පිරිසක් ජිවන වියදම දරා ගැනීමට නොහැකිව පාරට බැස්සේය.

මේ අතර 2023 පෙබරවාරි 12 වන දින ස්පාඤ්ඤයේ මැඩ්රිඩ් හිදි සෞඛ්‍ය සේවකයන්ගේ දැවැන්ත වැඩ වර්ජනයක් ක්‍රියාත්මක විය. මෙම වැඩ වර්ජනය හදුන්වනු ලැබුවේ සුදු රැල්ලල ලෙසය. මේ සදහා ලක්ෂ ගණනින් ජනයා වීදි වලට පැමිණ සහයෝගය දැක්වීය. එහි ප්‍රතිඵලය වූයේ එම සේවකයන් 15% වැටුප් වැඩිවිමක් දිනා ගැනීමය. මෙම වැඩ වර්ජනය ජයග්‍රහණයෙන් නිමා විය. එසේ ජයග්‍රහණය කිරීමට හැකි වූයේ එරට වාමාංශික ව්‍යාපාරය ජනතාව පෙර සූදානමක සහ වෘත්තිය සමිති , වෘත්තීය සමිතිවාදය ඉක්මවා කටයුතු කිරීමට සූදානම් වීමෙනි.

ඉහත සදහන් කල කරුණු ඔබ හමුවේ තැබීමට තීරණය කලේ යුරෝපයේ පවතින යථා තත්වය පිලිබද යම් අවබෝධයක් ලබා දිමටය. එමෙන්ම ප්‍රධාන ධනපති මාධ්‍ය ආයතන සැබෑ යතාර්ථය සැගවිමත් එක් හේතුවකි. අනෙක් අතට යුරෝපයේ සමාජවාදි වාමාංශික ලෙස හදුන්වන බොහොමයක් සංවිධාන හා පක්ෂ හුදෙක්ම නාමකරණයක් පමණක් වෙමින් පවතින අතර අනියම් ලෙස හෝ සෘජුවම මෙම ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීමට උත්සහ කිරීමෙන් සිටීමය.

උදාහරණ වශයෙන් 1938 වර්ෂයේ ලියෝන් ට්‍රොස්ට්කි ප්‍රංශයේදි නිර්මාණය කළ 4 වන ජාත්‍යන්තරය නියෝජනය කරන ප්‍රංශයේ NPA (NEW ANTICAPITALIST PARTY) නායකත්වය ප්‍රතිසංස්කරණවාදි පෙරමුණකට යාමට සමාජවාදී ඉදිරි දර්ශනය සම්පූර්ණයෙන්ම පාවාදී ඇත.

මෙම පක්ෂයේ අවසාන සම්මේලනය 2022 දෙසැම්බර් මස පැවැත්විමට යෙදුනද පක්ෂයේ නායකත්වය විසින් එම සම්මේලනය එදින කඩාකප්පල් කලේ පක්ෂය දෙකට බෙදා පලා යාමෙනි. දැන් එම පක්ෂයේ වාම මුහුණුවර වෙනම ගොඩනැගෙමින් ඇති අතර එම කොටස් තුලද යම් යම් වෙනස්කම් ඇති බවද පැහැදිලිය.

ප්‍රංශයේ (NPA) පක්ෂය දක්ෂිනාංශික ප්‍රතිසංස්කරණවාදයට ගෙන ගිය එහි නායකත්වයේ කොටසක්ම හතරවන ජාත්‍යන්තරයේද නායකත්වයේ සිටීම තව දුරටත් ඔවුන් විසින් ලෝක වැඩකරන ජනතාවගේ ජාත්‍යන්තර පක්ෂය නිර්මාණය කරන කාර්යය භාරය අවසන් වශයෙන් අත්හැර ඇති බව පසක් වේ.

එම නිසා දැන් යුරෝපය හා ලතින් ඇමරිකානු කලාප වල මෙන්ම ඇමරිකාවේ හා කැනඩාවේද ආසියාකරයේද නව ජාත්‍යන්තරයක් නිර්මාණය කිරීම පිලිබද අත්‍යවශ්‍ය කතිකාව මතු වී ඇත. එම වැඩපිළිවෙල ඉදිරියට ඒමට නියමිතව ඇත. බොහෝ දුරට කලාපීය මට්ටමෙන් එක්සත් විම් සිදු විය හැක. දකුණු ආසියානු කලාපය හා ආසියානු කලාපය සමාජවාදි කොමියුන් සංගමයක් ලෙස ඉදිරියට ගත යුතුය. ආජන්ටිනාව, බ්‍රසීලය , ස්පාඤ්ඤය පදනම් කර ගෙන ලමාක්ස් ල අධ්‍යයන කරන අලූත් කණ්ඩායම් ඒකාබද්ධ වෙමින් ඇත. ඒ වෙනුවෙන් දෑස් දල්වා ගෙන සිටින ලෙස ශ්‍රී ලංකාවද ඇතුළු දකුණු ආසියාවේ සියළුම සැබෑ සමාජවාදින්ගෙන් ඉල්ලා සිටිමු.■


දොණ් සමන්ත

CGT වෘත්තිය සමිති ක්‍රියාකාරි
(සෝර්බෝන් විශ්ව විද්‍යාලය - ප්‍රංශය )

..1956 බණ්ඩාරණායක අගමැතිවරයා ලංකාවේ මැයි දිනය නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත් කළේ එම දිනයේ දී කම්කරුවන් වැඩ නවත්වා උත්කර්ශවත් ආකාරයෙන් හා සටන් කාමීත්වයෙන් දහස් ගණන් මැයි දින පෙළපාලිවලට සහභාගී වීම වළකා ලීමටය. මෙම තීරණය පිටුපස ප්‍රබල දේශපාලන උවමනාවක් තිබුණි..

# මැයි දිනයේ උපත

ඊ.ඒ.පී අල්විස්

(මුද්‍රණ ශිල්පීන් සංගමයේ හිටපු සභාපති)



හේමාර්කට් චතුරාශ්‍රයේ බෝම්බ ප්‍රහාරය..

1860 ගණන්වල සිටම විශේෂයෙන් යුරෝපයේ කාර්මික රටවල්වල කම්කරුවෝ වඩාත්ම අඩු සේවා පහසුකම් හා වේතන මත, පැය 12 සිට 16 දක්වා වැඩ කල තත්වය මත අඩු පැය සේවය සඳහා වු ඉල්ලීම මතු වෙමින් පැවතුනි. ඔවුන්ගේ රජයන් හා කම්හල් හිමිකරුවෝ මොවුන්ව වහලුන්සේ සලකා වැඩ ගත් අතර අනතුරුදායක කම්හල්වල සේවකයෝ මරණයට පවා පත්වන විට එය ගණන් ගැනීමක් නොකළහ.

## පැය 8 ඉල්ලීම

1884 වසරේ දැනට ඇමෙරිකානු කම්කරු සම්මේලනය ලෙස හඳුන්වනු ලබන සංවිධානය විසින් චිකාගෝ නගරයේ පවත්වන ලද ජාතික කම්කරු සමුළුවේදී, 1886 ජනවාරි 1 වන දින සිට පැය 8ක සේවය නීත්‍යානුකූල හිමිකමක් ලෙස සේව්‍යයන්ගේ එකගතාවයක් නොමැතිවම ප්‍රකාශයට පත් කළේය. මෙම ප්‍රකාශයෙන් පසුව, ඇමරිකාව පුරාම මෙයට අනුකූලතාවය සහ සහයෝගය දක්වමින් දස ලක්ෂයකට වඩා කම්කරුවෝ තම ඉල්ලීම්වලට බලකිරීම සඳහා මැයි 1 වන දින වැඩ නැවැත්වීමක් සහ රැලියක් පැවැත්වූහ.

ඉතිහාසයේ පළමු මැයි දින සැමරුම 1886 මැයි 1 වන දින ඇමරිකාවේ පැවතුන අතර නොයෙකුත් කම්කරුවෝ කර්මාන්ත ශාලා 13,000ක, ලක්ෂ 3 කට ආසන්න පිරිසක් වැඩ වර්ජනයට බැස උද්ඝෝෂණය කළෝය. චිකාගෝ නගරයේ 40,000ක කම්කරුවෝ වැඩ නවත්වා තම පෙරටුගාමීත්වය හා කම්කරු ශක්තිය ප්‍රදර්ශණය කළේ ය. මොවුන් සමාජවාදී කම්කරු නායකයින් සමඟ එක්වී පවත්වන ලද රැස්වීමේ උණුසුම් කථා පැවතුනද කිසිදු හිංසාකාරී සිදුවීමක් නොවීය. මෙම තත්වය පරිවර්තනය වී චිකාගෝ නගරයේ ලක්ෂ සංඛ්‍යාත කම්කරුවෝ පැය 8ක ඉල්ලීම මත වැඩ වර්ජනය කරන ලදී.

## 1886 මැයි 03 වන දින හේමාර්කට් ඛේදවාචකය

මාස 06 ක කාලයක් මුළුල්ලේම හාම්පුතුන්ගේ හෙන්චයියන් හා පොලිසිය එක්ව සමාජවාදි



1887 නොවැ. 11 වන දින කම්කරු නායකයන්ගෙන් 4දෙනෙක ප්‍රසිද්ධියේ ම එල්ලා මරණ ලදි.
(ඡායාරූපය: චිකාගෝ ඉතිහාසය පිළිබඳ කෞතුකාගාරය)

නායකත්වයෙන් යුත් වෘත්තීය සමිතියක වානේ කර්මාන්තශාලා කම්කරුවන්ට පහර දී අස්කරන පිළිවෙතක් අනුගමනය කළේය. මෙම ක්‍රියාවලියට විරුද්ධව පිකටිංවලට සහභාගී වු 200ක් පමණ කම්කරුවන් පොලිස් බැටන් ප්‍රහාරවලට සහ වෙඩි තැබීම්වලටද මුහුණදීමට සිදුවිය. මෙයින් කම්කරුවන් දෙදෙනෙකුගේ ජීවිත අහිමි විය. මෙම කරුණ ගැන සාකච්ඡා කිරීමට එම සමිතිවල නායකයන් හේමාර්කට් චතුරශ්‍රයට එක්වෙන ලෙස කැඳවුම් කළේය. මෙය කෙටි දැන්වීමක් වු අතර, එදින අධික වර්ෂාව හේතුවෙන් 3000ක් පමණ සහභාගී වු අතර, මෙම රැස්වීමට චිකාගෝ නගරාධිපති ඔහුගේ බිරිඳ සහ දරුවන් සමඟ සහභාගි වීය. එම රැස්වීමේ කථිකයින් හිංසන අවුස්සන කිසිදු කථාවක් නොකල බවට ඔහු සාක්ෂි දැරීය. මෙම රැස්වීම අවසන් වීමට මොහොතකට පෙර පොලිස් ඔත්තුකරුවන් දෙදෙනෙකු මෙම රැස්වීමේ කථිකයින් හිංසනය අවුස්සන කථා පවත්වන බව පවසා පොලිස්සිය රැස්වීම් පැවැත්වුණ ස්ථානයට (හේමාර්කට් චතුරස්‍රයට) කැඳවාගෙන ආවේය. පොලිසිය රැස්වී සිටි පිරිස් විසුරුවා හැරීමට පියවර ගත් අතර ඒ අතරතුර කවුරුන් හෝ විසින් අත් බෝම්බ ප්‍රහාරයක් එල්ල කරන ලදි. (ඔහු පාලකයින්ගේ ඔත්තුකරුවෙකු බවට පසුව සැක කෙරිනි) මෙම ප්‍රහාරයෙන් පොලිස් නිලධාරියෙකු එතනම මරුමුවතට පත්විය. සතියකට පසු තවත් 7 දෙනෙක් මරණයට පත් වු නමුදු මොවුන්ගේ මරණ, පොලිසියේ වග විභාගයෙන් තොරව වෙඩි තැබීම නිසා බව ඔප්පු විය. මෙයට ප්‍රතිචාරයක් ලෙස පොලිසිය දිගට හරහට රැස්ව සිටි කම්කරුවන් දෙසට වෙඩි තබන්නට පටන් ගත් අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් කම්කරුවන් 7 දෙනෙකු ජිවිතක්ෂයට පත්විය. තවත් 40 කට ආසන්න පිරිසක් බරපතල තුවාලලැබු අතර කම්කරුවන්ගේ සුදු කමිස රතු ලේවලින් තෙත්විය. මෙම සිද්ධියෙන් පසුව කම්කරු පාට රතු බවට ප්‍රකට විය. ඒ ලේ රතු කමිස ගෙන කම්කරුවෝ නගරය පුරා පෙළපාලි දැක්වූහ.

## නායකයන් එල්ලා මරා දැමීම


මෙම සිද්ධියෙන් පසු මෙම ව්‍යාපාරයට නායකත්වය දුන් නායකයින් 8 දෙනෙකු අත් අඩංගුවට ගනු ලැබු අතර, පස් දෙනෙකුගෙන් යුත්  සභා විභාගයෙන් පසු 1887 නොවැම්බර් 11 වන දින මෙම නායකයන්ගෙන් 4දෙනෙකු ප්‍රසිද්ධියේ ම එල්ලා මරණ ලද අතර තවත් නායකයෙක් අනෙකුත් නායකයින් තිදෙනා වසර කීහිපයකට පසුව නිදහස් කෙරුණි. මෙම සිදුවීම වන විට මෙම නායකයින්ගෙන් වැඩි දෙනෙකු එම ස්ථානයේ නොසිටි අතර ඔවුන්ට මෙම දඩුවම් ලබා දෙන ලද්දේ ඔවුන් සමාජවාදී මත දරණ කම්කරු අයිතින් වෙනුවෙන් නායකත්වය දුන් නිසාය. කම්කරුවන්ගේ පැය 08ක සේවය සදහා අරගලයට නායකත්වය දුන් නිසාය

## මැයි දිනය ප්‍රකාශයට පත් කිරීම

මැයි 01 වන දින ලෝක කම්කරු දිනය වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දේ 1886 හේමාර්කට් සිදුවීම සිහි කිරීම සඳහාය. පසු කලක මෙම දිනය රටවල් ගණනාවකම නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදි. මේ ජාත්‍යාන්තර කම්කරු සංවිධානය විසින් හෝ එක්සත් ජාතීන්ගේ මණ්ඩලය විසින් මෙතෙක් ලෝක කම්කරු දිනය වශයෙන් ප්‍රකාශයට පත්කොට නැති නමුදු මෙම දිනය දිනාගෙන ඇත්තේ කම්කරුවන් විසින්ම ය. තවත් රටවල් කිහිපයක්ම මෙම කම්කරු දින සඳහා වෙනත් දින නිවාඩු දී ඇත. මෙම ඛේදවාචකය සිදුවු ඇමරිකාව මෙම දිනය හඳුන්වන්නේ ''**නීතිය සහ සාමය සඳහා වු දිනය**'' වශයෙනි. ඒ සඳහා ඔවුන් සැප්තැම්බර් 04 වන දින යොදාගෙන ඇත්තේ හේමාර්කට් සිද්ධිය අමතක කරවීම සඳහා ය.

## ලංකාවේ මැයි දිනය සැමරීම

ලංකාවේ මෙම දිනය 1930 ගණන් වල සිටම සමාජවාදී හා ලිබරල් වාදී පක්ෂයක් විසින් සමරා ඇති අතර 1956 - 64න් පසුව ලංකාවේ ධනේශ්වර පක්ෂය විසින් වෘත්තීය සමිති පිහිටුවා ඔවුන්ගේ පක්ෂවල දැවැන්ත පෙලපාලි සහ රැස්වීම්වලට විශාල කම්කරු පිරිසක් රැස්කරගත්තා පමණක් නොව කම්කරුවන්ට හිමි රතු පාටද සොරා ගන්නා ලදි. 1956 බණ්ඩාරණායක අගමැතිවරයා ලංකාවේ මැයි දිනය නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත් කළේ එම දිනයේ දී කම්කරුවන් වැඩ නවත්වා උත්කර්ශවත් ආකාරයෙන් හා සටන් කාමීත්වයෙන් දහස් ගණන් මැයි දින පෙළපාලිවලට සහභාගී වීම වළකා ලීමටය. මෙම තීරණය පිටුපස ප්‍රබල දේශපාලන උවමනාවක් තිබුණි. මෙම මැයි දිනය කම්කරු විරෝධි, කම්කරුවන්ව තම දේශපාලන උවමනා වලට යොදවා ගන්නා හා වෘත්තිය සමිති හරහා ඔවුන්ව කොටු කරගත් රතු, නිල්, කොළ පාට දේශපාලන පක්ෂ විසින් ඉතා අප්‍රසන්න ආකාරයෙන් සිහිකරන අතර, එම දිනයේ වටිනාකම සහ ගරුත්වය අවමානයට ලක් කර ඇත.■



# නයාට අඳු කොළ මෙන් රනිල්ට ප්‍රජාතන්ත්‍රවාදය විෂයි..

ශාන්ත විජේසූරිය

ප්‍රසුගිය දා ජනාධිපති නීතිඥ සාලිය පිරිස්ට එරෙහිව ආණ්ඩුව ලූම්පන් ජනයා යොදා ගනිමින් කොටුව දුම්රිය පොල ඉදිරිපිට විරෝධතාවක් පැවැත්විය. ඊට පෙර ජනාධිපති නීතිඥ පිරිස්ගේ බොරැල්ල කොටා රෝඩ් පාරේ පිහිටි ඔහුගේ කාර්යාලය ඉදිරිපිට විරෝධතාවයක් පැවැත්විණ.

.

ඒ ජනාධිපති නීතිඥ පිරිස් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකු යැයි පොලිසිය පවසන නදුන් චින්තක නොහොත් හරක් කටා වෙනුවෙන් පෙනිසිටීම එම විරෝධතාවයට ආසන්න හේතුවවී ඇත.

චින්තක සහ සලිදු මැඩගස්කර පොලිසිය අත්අඩංගුවට ගෙන පසු මෙරට බාර දෙන ලදි.

තරුණ පරපුර විනාශ කරන මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් වෙනුවෙන් පෙනිසිටින්නට එපා යැයි විරෝධතාකරුවන් ජනාධිපති නීතිඥ පිරිස්ගෙන් ඉල්ලා සිටියහ. එම විරෝධතාකරුවන් අතර චින්තක සහ සලිදු විසින් මරාදැමුවා යැයි කියන අයගේ දෙමව්පියන් සහ ඥාතීන් ද සිට තිබේ .

ජනාධිපති නීතිඥ පීරිස්ට එරෙහිව එම විරෝධතාවය පැවැත්වීම සම්බන්ධයෙන් චෝදනා එල්ල වි ඇත්තේ මහජන ඇමති ටිරාන් අලස්ට සහ බස්නාහිර පළාත් භාර නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකොන්ට .ධනපති ක්‍රමයේ උග්‍ර අර්බුදය විසින් නන්නත්තාර කරන ලද පහල මධ්‍යම පාන්තික තරුණ කොටස් ඉන් ගොඩ එම සඳහා මත්ද්‍රව්‍ය ජාවාරම් මෙන්ම මානව විරෝධී ක්‍රියාකාරකම් හරහා මුදල් හම්බකරන්නට යැම නිසා ඇති වන තරගය එම කා කොටා ගැනීම් වල පසුබිමේ පවති.

ධනපති ආණ්ඩු නිත්‍ය හමුදා වලට අමතර මහජනයාට එරෙහිව මෙවැනි පාදඩ සමාජ කොටස් නිල නොවන හමුදා ලෙස යොද ගනී . රහස් හෙළි වෙතැයි සහ ඔවුන් තමන්ගේ පාලනයෙන් ගිලිහි යන විට ආයුධ පෙන්වන්ට යැයි රැගෙන ගොස් මරා දමයි . ගොනවල සුනිල්ලා සහ සොත්ති උපාලිලා ආණ්ඩු වලට සම්බන්ධ මැර කණ්ඩායම් මෙහෙයුවන් වෙති

.

**''ජනාධිපති නීතිඥ පිරිස් ජාත්‍යන්තර මත්ද්‍රවය ජාවාරමකරුවන් අතර කප්පිත්තා වන චින්තක නොහොත් හරක් කටා වෙනුවෙන්අද පෙනිසිටින ගමන් පොලිස්පති කෙබඳු අයෙකු විය යුතු දැයි පවසන බවත් අරයා දූෂිතයි මෙයා දූෂිතයි දේශපාලනඥයා දූෂිත යැයි කියන ඔහු ලොකුම දූෂිතයා බව''**

රාජ්‍ය ඇමති ඉන්දික අනුරුද්ධ හේරත් පසුගියදා පාර්ලිමේන්තුවේදි අදහස් දක්වමින් පැවැසීය. ඊට රුකුල් දෙමින් රාජ්‍ය ඇමතිසි. වි . ජානක ද ජනාධිපති නීතිඥ පිරිස්ගේ නම සඳහන්නොකර ඔහුට එරෙහිව අවලාද නගන ලදි.

රාජ්‍ය ඇමති අනුරුද්ධ හේරත් එම වාසි බස් දොඩා වන්නේ පාර්ලිමේන්තු වරප්‍රසාද වලට මුවා වි ගෙනය .රාජ්‍ය ඇමති අනුරුද්ධ හේරත් සහ ආණ්ඩුව ජනාධිපති තිනීතිඥ පිරිස් සමග ඇති ආරවුල වන්නේ හරක් කටා වෙනුවෙන් පෙනීසිටීම නොව ගාලූමුවදොර අරගලකරුවන් වෙනුවෙන් පෙනිසිටීමත්. නව පොලිස්පතිවරයා පත් කරද්දි,

අපරාධ සහ මානවහිමිකම් නඩු නැති පුද්ගලයෙකු පත්කරන ලෙසත් විධායකය දේශපාලඥයන් ලවා අධිකරණයේතීන්දු වලට කරන බලපෑම වහාම නතර කරන ලෙසටත් නීතිඥ සංගමය ජනාධිපතිවරයාට දන්වා යැවීමත්ය. නීතිඥ පිරිස්

චින්තක හෙවත් හරක් කටාගේ ජිවිත ආරක්ෂාව වෙනුවෙන් පෙනීසිටීම ප්‍රශ්න කරමින් ,පාලක පන්තියට නීතිඥ පිරිස් සමග පැවති වෛරය මුදා හැරියේය.

**''නීතිඥ සංගමයේ සභාපතිවරයා අරලගකරුවන් රැක්කා පමනක් නොව ඔවුන් වෙනුවෙන් පෙනිසිටි බවත් රට විනාශ කරන්න ආපු අය සමග ඔහු පාරට ආව බව''** කියමින් රාජ්‍යඇමතිවරයා නීතිඥ පිරිස්ට බැණ තර්ජනය කරයි. ගෝඨා *රනිල් ආණ්ඩුව පලවාහැරීම සඳහා විදීබට කම්කරු*පීඩිත මහජනයා වෙනුවෙන් පෙනීසිටි නිසා පාලක පන්තියේ

වෛරය ජනාධිපති නීතිඥ පිරිස් කෙරෙහි එල්ල වි තිබේ.

මැතිවරණ කොමිසම තමන්ගේ නීතිඥයා ලෙස ඉදිරිපත් කර ඇත්තේ දේශපාලනය කරන සාලිය පිරිස් බවත් ඔහු වෙනුවට සමගි ජන බලවේගයේ හෝ ජාතික ජන බලවේගයේ නීතිඥයෙකු යොදා ගත්තා නම් මිට හොද බව පවසමින් ජනාධිපති වික්‍රමසිංහ නීතිඥ පිරිස්ට එරෙහිව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් උසිගන්වා ඇත. ධනපති ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කැප වි සිටින නීතිඥ පිරිස්ට එරෙහිව ,ජනාධිපති වික්‍රමසිංහගේ විරෝධය හුදු පුද්ගලික එකාක් නොව අඩුම තරමේ ධනපති පාලක පන්තියට නීතිඥ පිරිස් ඉල්ලන ධනපති පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයවත් දීමට ඇති නොහැකියාව විසින් වාන්දමන විරෝධයකි . අරගලකරුවන් ජනාධිපති මන්දිරය , අරලිය ගහ මන්දිරය, ජනාධිපති ලේකම් කාර්යාලය සහ අගමැති ලේකම් කාර්යාලය අල්ලා ගනිද්දී ඊට විරුද්ධ වුවා පමනක් නොව එවා අතහරින්නැයි ඔහු අරගලකරුවන්ගෙන් ඉල්ලා සිටියේය . පිරිස් කියන දේවල් කරන්න අරගලකරුවන් සුදානම් නැතැයි මම කියද්දී, පීරිස්ගේ මතවාදයට පක්ෂ පිරිස් සහ මා අතර ගැටුමක් ද නිර්මාණය විය. ලංකාවේ ධනපති ක්‍රමය යනු ගෝලිය ප්‍රපංචයකි. ලෝක පරිමානව ධන කුවේරයන් සුළු පිරිසක් විසින් වැඩකරන ජනයාගේ ශ්‍රමය සූරාකමින් සමස්ත අර්බුදයේ බර කම්කරු මහජනයා මත පැටවීම ධනපති ක්‍රමයේ අර්බුදයයි . එම අර්බුදය නීති ආධිපත්‍ය සහ ප්‍රතිසංස්කරණ හරහා වඩා යහපත් ධනපති සමාජයක් නිර්මානය කළ හැකි යන මිත්‍යාවේ ජනාධිපති නීතිඥ පීරිස් පැටලි ඇත. ජනාධිපති රනිල්ට ප්‍රජාතන්ත්‍රවාදය යනු නයාට අඳු කොළ මෙන් විෂය . අයිඑම්එෆ් ආර්ථික පිළිවෙත ක්‍රියාවට දැමීමට එරෙහි සෑම ප්‍රයත්නයක් ම ත්‍රස්තවාදී ක්‍රියාවක් ලෙස නම් කර මර්දනය කිරීමට රනිල් සැරසෙයි.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ කොළඹ රාජකීය විද්‍යාල ඇතුළු පාසැල් 12 ක අවශ්‍යතාවය මත ජනාධිපති වික්‍රමසිංහ ජාතික පාසැල් ගුරුමාරු මණ්ඩල අත්තනොමතිකව විසුරුවා හැරීමට එරෙහිව ගුරුසංගම් සංවිධානය එකතු වී පැවැත්තු වු විරෝධයට මැදට කොලොන්නාව සහ මීතොටමුල්ල ප්‍රදේශ වල ජිවත් වන පැල්පත්වාසී ජනයා ගෙනැවිත් දමා ගැටුමක් නිර්මානය කිරීමට ආණ්ඩුව උත්සහයක නිරත විය.

ගුරුසංගම් වලට එරෙහිව මෙම පිරිස් රැගෙනවිත් ඇති බවට චෝදනා එල්ල වි ඇත්තේ සිංහල ස්වෝත්තමවාදියෙකු වන ඩෑන් ප්‍රියසාද්ට සහ උතුරු කොළඹ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායක රවිකරුණානයකටය.

මිට පෙර ද ආණ්ඩුව අරගලකරුවන්ට එරෙහිව ගාලූමුවදොර පිටියේ වෙළදාම් කරන පිරිස් උසිගැන්වීමට කටයුතු කළේය .කොටුව චිත්තම්පලම් ගාඩන් හි පිහිටි ලංකා ගුරු සංගම් කාර්යාලය වැටලූ දෙමව්පිය ලෙස වෙස්වලා ගත් ප්‍රියසාද් ඇතුළු පාදඩයින් පිරිසක් එම සංගම් කාර්යාලයට කඩාවැදීමට උත්සහ කළහ. ආණ්ඩුවට ජනතාවගේ එකදු මුලික ප්‍රශ්නයක් විසඳීමට අපොහොසත් වි ඇති තත්ත්වයක් යටතේ පුපුරා යන අරගල පසු බැස්සවීමටත් මහජනයා බියවැද්දවීමටත් පොලිස් සහ හමුදා බුද්ධ අංශ අමතරව ප්‍රියසාද්ලා වැනි පාදඩ නඩු ඉදිරියේදී වැඩි වැඩියෙන් යොදා ගනු ඇත.

ආණ්ඩුව මහජන අරගල මර්දනය කිරීම සඳහා පොලිසීය මිලිටරිය , කදුළු ගෑස් සහ ජල ප්‍රහාර සහ ත්‍රස්ත අණ පනත් වලට අමතරව ජිවත්විමේ සහ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ධනපති ආණ්ඩුවට එරෙහි සටන්වදින කම්කරු -

පීඩිත මහජනයා මැඩලීමට ධනපති ක්‍රමය මගින් හිගමනට ඇද දමපු පිඩිත මහජනයාව එම අරගල වලට එරෙහිව

යොදා ගැනීම ධනපති මිලේච්ඡත්වය මෙන්ම ධනපති ක්‍රමයේ බංකොළොත්කම එළිමහනට ප්‍රදර්ශනය විමකි  ආණ්ඩුව අනිකුත් කම්කරු - පිඩිතයින්ගේ අරගල වලට එරෙහිව අනුගමනය කළ පිළිවෙත අනුව යමින් නීතිඥ පීරිස්ට එරෙහිව ද හරක් කටාගේ සහ පානදුර සලිදුගේ එදිරිවාදීන් සහ පාදඩයින් යොදාගෙන තිබේ. ආණ්ඩුවේ මැර හමුදා විසින් මාකදුරේ මදුෂ්ක සහ කොස්ගොඩ තාරකව ආයුද පෙන්වන්නට යැයි රැගෙන ගොස් මරා දමා ඇත්තේ අපරාධ පරිත්ෂණ දෙපාර්මේන්තුව, බන්ධනාගාරය සහ අධිකරණය භාරව සිටියදිය .

මදුෂ්ව ඩුබාසි පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන මෙරට භාරදුන් සැකකරුවෙකි .මදුෂ් ,තාරක පමනක් නොව තවත් සිය ගණනක් තරුණයන් ආයුද පෙවන්නට යැයි රැගෙන ගොස් මරා දමන ලදී. චින්තකට හෝ සලිදුට එරෙහිව ඇති කිසිදු මත්ද්‍රව්‍ය නඩුවක් වෙනුවෙන් ජනාධිපති පීරිස් පෙනි සිට නැති අතර එසේ පෙනි නොසිටින්නැයි කියන්නට ද අපට අයිතියක් නැත. පෙනී සිටිනවාද නැද්ද යන්න තීන්දු කිරීමේ අයිතිය ඇත්තේ ඔහුටය .

අයිතිවාසිකම් පිළිබද ගැටුමක් ඇති නොවෙනතාක් ඕනෑම

6 වන පිටුවට

රනිල් ගේ අපේක්ෂාව.. 1 පිටුවෙන්

මෙවැනි පනත් සම්මත කිරීම මගින් වංචා දූෂණ නතර කිරීමට නොහැක. එයට හේතුව වන්නේ මේ පනත ගෙනඑන පාලකයින් ඉතිහාසය පුරාම වංචාවෙන් හා දූෂණයට ලක් වුවාන් වීමය. මේ වාගේ කතා බොහෝ විට අප අසා ඇත. රට සුරපුරයක් කරන බවට කරනු ලැබු ප්‍රකාශ ජනතාව නිතර දැක තිබේ. අධිකාරි බලය පසුගිය පාලන සමය තුළද මෙවැනි පනත් බොහෝ විට සම්මත කර තිබේ. තොරතුරු දැනගැනීමේ පනත රටට හඳුන්වාදුන්නේ ය. යහපාලනය යටතේ පිහිටුවන ලද ස්වාධීන කොමිෂන් වලින් ලැබෙන ප්‍රතිඵලය ගැන මවන සිහින අද සැබෑ වි නැත. මේ කොමිෂන් සභා පත් කිරීමට කටයුතු කළ පිරිස අතරින් වැඩි දෙනෙකු මේ ගැන කථා කරන්නේ නැත. ස්වාධීන කොමියුනිටි සභා නඩත්තු කිරීමට සිදු වී ඇත්තේ ජනතාවගේ බදු මුදල් වලිනි. තොරතුරු දැනගැනීමෙන් දූෂණය හා අල්ලස් මැඩ පැවැත්විය හැකි අතර රජයේ අවනීතිය පාලනය කළ හැකි බවට විශ්වාසයෙන් පැන නැගිනි. මේ සඳහා පත්කරනු ලැබු නිලධාරින්ගේ අනුමැතිය ගැනීමට නොහැක. අවසානයේ අධිකරණ තීන්දුවකින් තොරව අනාවරණය කර ගන්නේ නමුත් කළ හැකි දෙයක් නැති තරමට ක්‍රමය විකෘති වී තිබේ.

ධනපති ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ දූෂණය, හොරකම හා වංචාවෙන් පිරී ඇති ක්‍රමයක් බවය. ධනේශ්වර සංවර්ධනයවත් පූර්ණ නොවු ලංකාව වැනි රටවල මෙය දිගින් දිගටම දකින්නට තිබේ. මෙම වංචාවට හොර කමට වගකිව යුත්තේ රනිල් මහින්ද ඇතුළු සියලූ පාලකයින් බව මේ වන විට ඔප්පු වී තිබේ. ඇමතිවරයාගෙන් ආරම්භවන මේ දූෂිත ක්‍රියාවන් නිලධාරින් දක්වා ඔඩුදුවමින් තිබේ. සමස්ථ සමාජයටම අඩු වැඩි වශයෙන් අතයට හුවමාරු වන ධනයෙන් යැපෙන බව පෙන්වා දිය යුතුය.

රාජ්‍ය ආයතනවල අත යට ගනුදෙනු බහුලව සිදුවේ. සාමාන්‍ය ජනතාව එහි ගොදුරු බවට පත්ව ඇත. ඉඩමක රාජකාරියක් කර ගැනීමේදී ක්ෂේත්‍ර නිලධාරිහු ජනතාවගෙන් අල්ලස් ගනිති. ඉඩම අනුමත කිරීම, තක්සේරු , සැලැස්ම අනුමැතිය ආදී වශයෙන් සෑම පියවරකදී ම ගෙවන්නට සිදුවන බව ජනතාව නොදන්නවා නොවේ. තේ සහනාධාරයෙන්, පොහොර සහනාධාරයෙන් ද තමන්ගේ කොටස වෙන්කර ගන්නා නිලධාරී හු එමටය. පසුගිය කන්නයේ වගා හානි වලට ගොවියන්ට ගෙවන වන්දිය නොලැබුණි. නිසි පරිදි දත්ත සම්පූර්ණ කර නැත. අතට මුදලක් ගෙවන ලද ගොවියන්ගේ ලේඛන සම්පූර්ණ වු බව සැක කළ හැකිය. රජයේ නිලධාරීන් පිරිස ලක්ෂ 13 කි. මෙම සියලූ පිරිස හොඳ වැටුපක් ලබන්නෝ නොවෙති. ජීවත් වීම සඳහා කරගෙන යන අරගලය තුළ තමන්ට වාසි ඇති තැනින් කෙසේ හෝ යමක් පැහැර ගැනීම දූෂණයක් සේ නොසලකන තරමට රට විනාශ වී ඇත.

අණ පණත් ඇත. නීතියද බලවත් ය. ක්‍රියාත්මක වන විට වරදක් වී නැත. බරපතල වංචා සහ අතිශය දරුණු මූල්‍ය චෝදනා අනාවරණය වු අවස්ථා විශාල ප්‍රමාණයකි. දේශපාලඥයින්, මැතිඇමතිවරුන් නිලධාරිහු සැහෙන පිරිසකට චෝදනා එල්ලවේ. අධිකරණයේ දී නිදොස් කොට නිදහස් කෙරේ. විපක්ෂයේ දී පැවරෙන නඩුව, ඡන්දයෙන් ජයග්‍රහණය කර ආණ්ඩුවට පැමිණෙන පසු ඉවත් කර ගැනීම සාමාන්‍ය සිද්ධියක් බවට පත්ව ඇත. එවැනි රටකට තවත් දූෂණය  නැවැත්වීමේ පනත් සම්මත කිරීම අවශ්‍ය කාර්යක්ද?

ගැටුම් හා දූෂිත තත්වයන් අතර මනා සම්බන්ධතාවයක් ඇත. ශ්‍රී ලංකාවේ දූෂණ හා වංචාවලට දේශපාලනය අත් උදව් කරන නමුත් සැබෑ උපකාරකය බවට පත්වුයේ ගැටුම් බව සඳහන් කළ යුතුය. 75 වසරක නිදහසින් පසු කාලපරිච්ඡේදයේ දී ආගමික ජනවර්ග හා දේශපාලන කරුණු පදනම් කරගෙන ගැටුම් හා ත්‍රස්තවාදය හටගෙන තිබේ. ගැටුම් සමඟ අවි ගණුදෙනු සහ මත්ද්‍රව්‍ය ජාවාරම් ඉහවහ යන පසුබිමක් නිර්මාණය වන අතර ඒ දූෂිතයන්ට ඉතා කූඨෝපානුකූල අවස්ථාවකි. 2018 වසරේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානය ගැටුම් හා දූෂණය පිළිබද පළමු වතාවට සැසිවාරයක් සංවිධානය කර තිබුණු අතර එහිදී ගැටුම් තත්ත්ව හෙයින් දූෂණය ලෝකයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට පහක් පමණ වන අතර ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 2.6ක් බව ප්‍රකාශ වී ඇත.

මේ දත්ත අනුව ධනපති ක්‍රමය විසින්ම නිර්මාණය කර තිබෙන දූෂණ වංචා පිළිකාවන් බවට පත් වී තිබේ.එය පවතින ධනපති ක්‍රමය බිඳ දමා ඇති කරන සමාජවාදී පාලනයක් මගින් ජයගත හැකි බව ගැඹුරින් තේරුම්ගත යුතුව ඇත. ■

# ප්‍රතිත්‍රස්ත පනත මරඋගුලක්



..මේ තත්ත්වය ඉදිරි ජනතා විරෝධයන් මර්දනය කිරීමට මේ පනත භාවිතයට යොදා ගැනීමට බලාපොරොත්තුවේ. මෙමගින් භාෂනයට තිබෙන අයිතිය උදුරා ගැනීමට, නිදහස  උදුරා ගැනීමට ක්‍රියාකරන අතර ඉතිහාසය පුරා ජනතාව දිනාගත් සියලූ ප්‍රජාතන්ත්‍රවාදී අයිතින් වළ දැමීමට ක්‍රියා කරනු ඇත. ධනපති ප්‍රජාතන්ත්‍රවාදයේ සියලූ අයිතින් මේ මගින් උදුරා ගැනීමට කටයුතු කිරීම මගින් පෙනීයන්නේ ඒකාධිපති රාජ්‍යයක් ගොඩනැගීම කරා ගමන් කිරීමක් ලෙසය. පවතින පාලකයින්ගේ වංචා දුෂණ හොරකම් හෙළිදරව් කිරිමට ද මේ පනත මගින් වළක්වා ලීමට කටයුතු කරනු ඇත..

■ ප්‍රේමචන්ද්‍ර විතාණවසම්

1979 ගෙනඑන ලද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත තවදුරටත් තිව්‍ර කරමින් ප්‍රතිත්‍රස්තවාදය නමින් පනතක් ගෙනඒමට රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා සැලසුම් කරමින් තිබේ. මේ පනත පාර්ලිමේන්තුවට ගෙන ඒමට පෙර එහි ඇති බියකරු ස්වභාවය පිළිබඳ කතිකාවක් ආරම්භ වෙමින් තිබේ. එම කතිකාව පිළිබඳ විවිධ මුහුණුවරින් දැනටමත් අදහස් ඉදිරිපත් වෙමින්ඇත. රනිල් වික්‍රමසිංහ ඇතුළු පාලකයින්ට එරෙහිව ඇතිවන ජනතා විරෝධය වලක්වා ගැනීමට ප්‍රතිත්‍රස්ත පනත භාවිතයට දැමීම මගින් හැකි වේයැයි අදහස් කරන බව පෙනේ. පසුගිය 2022 මාර්තු - මැයි අරගලය නැවත ඇති නොවීමට අවශ්‍ය සැලසුම් ක්‍රියාත්මක කරනු ලැබුවත් පාලකයින් කරණු ලබන කුරිරු මර්දනය ..... වනු ඇති බව ඉතිහාසය සනාථ කර තිබේ.

70  දශකය සහ 80 දශකවල උතුරේ හා දකුණේ ඇති වු කැරළි යකඩින් හා ලෙයින් පරාජය කිරීමට පාලකයින් කටයුතු කළේ ය. එම ආයුධ සන්නද්ධ කැරළිවල වැරදි විධික්‍රමයන් විසින්ම ඒවාගේ විනාශ ආරම්භය සිට අවසානය දක්වා සනිටුවන් වී තිබුණි. ලාංකීය ඉතිහාසයේ පසුගිය වසරේ දකින්නට ලැබු ඉහත ජනතා නැගි සිටිම්වලට වඩා පොදු ජනයාගේ වඩාත්ම ආශිර්වාදය දිනාගත් බහුජන නැගිටීමක් ලෙස එය හැඳින්වීමට හැකිය. ඒ නිසා රාජපක්ෂ පරාජය කර ඔවුන් එළවා දැමීමට එම අරගලයට හැකිවිය. මෙවන් නැගිටීමක් පාලකයින් කිසිවිටක බලාපොරොත්තු වුයේ නැත.

මෙම ජනතා නැගිටීම ලෙයින් හා යකඩින් පරාජය කිරීමට නොහැකි වුයේ එය සාමකාමී ජනතා නැගිසිටිමක් වු බැවිනි. මෙයින් තැතිගත් රනිල් වික්‍රමසිංහ ජනාධිපති වරයා මේ වන විට කුඩා ජනතා විරෝධයක් ද ආරම්භයේ දී ම මැඩපැවැත්වීමට කටයුතු කරමින් තිබේ. කුඩා පිරිසකටද පා ගමනක් යන්නට නොහැකි ලෙස හමුදාව හා පොලිසියේ විශාල පිරිසක් කැඳවා එයට බැරියර් යොදා අවසානයේ කඳුළු ගෑස් ජල ප්‍රහාර එල්ල කිරීමට කටයුතු කරනු ලැබේ.

මේ තත්ත්වය ඉදිරි ජනතා විරෝදයන් මර්ධනය කිරීමට මේ පනත භාවිතයට යොදා ගැනීමට බලා පොරොත්තුවේ. මෙමගින් භාෂනයට තිබෙන අයිතිය උදුරා ගැනීමට, නිදහස උදුරා කරගැනීමට ක්‍රියාකරන අතර ඉතිහාසය පුරා ජනතාව දිනාගත් සියලූ ප්‍රජාතන්ත්‍රවාදී අයිතින් වළ දැමීමට ක්‍රියා කරනු ඇත. ධනපති ප්‍රජාතන්ත්‍රවාදයේ සියලූ අයිතින් මේ මගින් උදුරා ගැනීමට කටයුතු කිරීම මගින් පෙනීයන්නේ ඒකාධිපති රාජ්‍යයක් ගොඩනැගීම කරා ගමන් කිරීමක් ලෙසය. පවතින පාලකයින්ගේ වංචා දුෂණ හොරකම් හෙළිදරව් කිරීමට ද මේ පනත මගින් වළක්වා ලීමට කටයුතු කරනු ඇත. ඕනෑම පුද්ගලයෙකු අත් අඩංගුවට ගැනීමට නියෝජ්‍ය පොලිස්පතිවරුන්ටද ඊට අමතර ඕනෑම පක්ෂයක් හෝ සංවිධානයක් තහනම් කිරීමේ බලයද ජනාධිපතිට ලැබී තිබේ. රටේ සමස්ත ජනතාවම ත්‍රස්තවාදීන් බවට පත් කිරීමේ විභවතාවයක් මෙහි අනියම් ලෙස අර්ථගන්වා තිබීම මගින් එහි බියකරුභාවය තවත් සනාථ වනු ඇත.

> ''ජනතාවගෙන් ඇතමෙක් විසින් හෝ සියලූම ජනතාව විසින් ත්‍රස්ත්‍රවාදය පිළිබඳ වැරදි සිදු කිරීමට, ඒ සඳහා සුදානම් වීමට හෝ
>
> පෙළඹවීමට ඔවුන් ඍජුව හෝ වක්‍රව දිරිගන්වන්නක් හෝ පොළඹවන්නක් ලෙස තේරුම්ගැනීමට ඉඩ ඇති යම් ප්‍රකාශයක් පලකරන්නා වු හෝ පලකිරීමට කටයුතු සකස්වන්නා වු හෝ එවැනි වචනයක් හෝ වචන කථා කරන්නාවු හෝ සංඥා හෝ දෘශ්‍ය නිරූපණය සිදුකරන්නාවු සහ එමගින් ත්‍රස්ත්‍රවාදය පිළිබඳ වරද සිදු කිරීමට, ඊට සුදානම් වීමට හෝ පෙළඹවීමට හෝ වක්‍රව දිරිගැන්වීමට හෝ පෙළඹවීමට අරමුණු කරගන්නා වු හෝ එම ප්‍රකාශයන් ජනතාව ත්‍රස්ත්‍රවාදය පිළිබඳ වරද සිදු කිරීමට, ඊට සුදානම් වීමට ගැන්වෙන්නේ ද නැතහොත් පෙළඹවෙන්නේ ද යන්න පිළිබඳ අනවධානීව සිටින්නා වු යම් තැනැත්තෙක් යම් පනත යටතේ වරද සිදු කරන්නේ ය..''

ඉහතින් උද්දිත කරන ලද විධි විධාන අදාළ වන්නේ මුද්‍රිත මාධ්‍ය, අන්තර් ජාලය, ඉලෙක්ටොනික මාධ්‍ය හෝ වෙනත් ආකාරයක ප්‍රසිද්ධ දැන්වීම් මගින් සිදුකරන ප්‍රකාශ සඳහාය. එහි ප්‍රකාශ යන්නද තවදුරටත් විග්‍රහ කරමි. ත්‍රස්ත්‍රවාදය දිරිගැන්වීම යටතේ සඳහන් කර ඇත්තේ

> ''ත්‍රස්ත්‍රවාදය පිළිබඳ වරද සිදුකිරීම හෝ ත්‍රස්ත්‍රවාදය පිළිබද වරද සිදු කිරීම සඳහා සුදානම් වීම උත්කර්ශයට නංවන සහ උත්කර්ශයට නංවා ඇති ක්‍රියාව උත්කර්ශයට නංවා ඇත්තේ පවත්නා අවස්ථානුගත කරුණු යටතේ ඔවුන් විසින් අනුකරණය කළ යුතු ක්‍රියාවක් ලෙස යැයි ජනතාව විසින් වටහා ගනු ඇති බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි සෑම ප්‍රකාශයක්ම ඇතුළත් වේ''

යනුවෙන් ය.

එසේම ''ත්‍රස්ත්‍රවාදී ප්‍රකාශණ ප්‍රචාරය කිරීම'' යටතේ ද මාධ්‍ය එම වරද සිදුකරන පාර්ශවයක් ලෙස ඇතුළත් කර ඇති අතර ඒවා විස්තර කරමින් සඳහන් කර ඇත්තේ එකී ප්‍රකාශන විවිධ පැතිමානයන්ගෙන් සලකා බලමින් චේතනාන්විතවම සිදුකර ඇද්ද යන්න සැලකිල්ලට ගත යුතු බවය.

ඇත්තටම මෙවැනි සැලකිල්ලට ගැනීම් යනු කන්න වුවමනා වු විට කබරගොයාත් තලගොයා කරගැනීමේ මර්දනකාරී ආණුඩුව, අයිසිං තැවරීම් බව මෑත ඉතිහාසය තුළ දැන් බලාත්මක ත්‍රස්ත්‍රවාදය වැළැක්වීමේ පනත යටතේ අපට ඔප්පු කර ඇත. එහි හොදම උදාහරණය වන්නේ ශී.ඒ.තිස්සනායගම්ව ඔහු සංස්කාරක ධූරය දැරූ නොර්ත් ඊස්ට් හෙලර්ඩ් සඟරාවට අවස්ථා දෙකක දී ලියු ලිපි දෙකක වාක්‍ය කිහිපයක් නිසා රටේ ජාතීන් අතර නොසන්සුන් තාවයක් ඇතිකිරීම සම්බන්ධයෙන් දඩුවමකට ලක් කිරීමය. එම පල කිරීමෙන් අවුරුදු දෙකකට පමණ පසු ඔහුට දඩුවම් ලබා දුන්න ද එවැනි මහජන නොසන්සුන් තාවයක් එම කාලයේ ඇති වි තිබුණේ නැත. ඇත්ත වශයෙන්ම සීමිත පිරිසක් දැන සිටි එම සඟරාව හා එහි පල වී තිබු ලිපි දෙක මහජන නොසන්සුන් තාවයක් අතිවීම කෙසේ වෙතත්, ඒ පිළිබඳ ජනතාව පවා දැනගත්තේ ඒ පිළිබද නීතිමය ක්‍රියාමාර්ග ගැනීමෙන් පසුවය.

ඉහතින් සඳහන් කරන ලද  මෙම පනතේ ත්‍රස්තවාදී ක්‍රියා ලෙස නම් කර ඇති අත්‍යවශ්‍ය සේවා වලට අයත් වෘත්තීය සමිති මෙම පනත සම්මත වී ක්‍රියාත්මක වන අවස්ථාවක මොනවුන්ගේ යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් වෘත්තීය සමිති ක්‍රියාත්මක කරගනු ලැබ ඇති අවස්ථාවක් අප සලකා බැලූවහොත් එය මාධ්‍ය මගින් වාර්තා කිරීම ඒ මොහොතේ ආණ්ඩුවේ සිතීම අනුව වරදක්වීමේ අනිවාර්ය වෙනු ඇත.

මෙම පනත යටතේ වරදකරු කරන යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ 306 වන වගන්තිය අදාළ නොවිය යුතුය යන්න සඳහන් කර ඇති අතර පනත යටතේ නියෝග සාදනු ලබන්නේ ජනාධිපතිවරයා විසින් ය. වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද එය නොතකා මෙම පනතේ විධිවිධාන බලපැවැත්වෙන අතර වෙනත් ලිඛිත නීතියක යම් ගැටීමක් හෝ අනුකූලතාවයක් ඇතිවුවහොත් මෙම පනතේ විධිවිධාන බලපැවැත්වෙන බව සඳහන් කර තිබේ. ඒ අනුව මෙම පනත මේ ආකාරයේ වු සියලූ අණ පනත් වලට ඉහළින් ක්‍රියාත්මක වන බවත්, එහි බලධාරියා වශයෙන් ජනාධිපතිවරයා කටයුතු කරණ බවත් පැහැදිලි ය.

මෙම පනත ක්‍රියාත්මක වීමෙන් පසු දැනට ක්‍රියාත්මක ත්‍රස්ත්‍රවාදය වැළැක්වීමේ පනත අහෝසි වන අතර එමගින් මේ දක්වා සිදුකර ඇති කාර්යන්ට අගතියක් සිදු නොවේ.

එහෙත් ප්‍රශ්නය වන්නේ දැනට ඇති පනත ඉතා භයානක පනතක් හෙයින් එය අහෝසි කර ජාත්‍යන්තර ප්‍රමිතියේ පනතක් ගෙන ඒම යටතේ මේ ගෙනවිත් ඇත්තේ අහෝසි කළයුතු යැයි කියන පනතටත් වඩා භයානක පනතක් වීම ය. ■

අසනි

495, මාකොළ උතුර, මාකොළ.
Tel: 077 9053016 / 077 7035167
Web: https://asanivoice.org

## රාස්ස සහ පරාස්ස...!

අපේ ළමා අවදියේ දී රාස්සයින් හා පරාස්සයින් ගැන කථා අසා ඇත්තෙමු. රාස්සයින්ට වඩා පරාස්සයින් දරුණු යැයි ද කියැවිණ. එපමණක් නොව පරාස්සයින් විසින් රාස්සයින් මරාදමන බවද කියනු ඇසුවෙමු. දැන් මේ රටේ ද එවැනි රාස්සයින් වෙනුවට පරාස්සයින් බිහිවීමේ තර්ජනයක් පහළවෙමින් තිබේ.

එදා නවසිය හැත්තෑ අටේ දී පමණ ජේ.ආර් ත්‍රස්ත මර්දන පනත හඳුන්වා දුන් දා සිට රටට සිදුවූ විනාශය කොපමණ දැයි කිසිවකුට ගණනය කළ නොහැකිය. නැතිවුනු ජීවිත හා දේපළ කොපමණදැයි අදටත් රහසකි. ඒවා පිළිබඳ සවිස්තරාත්මක වාර්තා ඇත්තේද නැත. නීතිය වල් වැදුනා පමණි. උතුරේ පැවැති අරගල හා දෙමළ තරුණයින් මර්දනය සඳහා ඒ කුරිරු මර්දනය හොඳින් හඳුනාගත් අප අතලොස්සක් විරුද්ධ වූ නමුත් දකුණේ ජාතිවාදී පිරිස් 'දෙමළුන්ට විතරක් නොවැ' යැයි කියමින් මෞනව්‍රතය රැක්ක හ. අද වනවිට මහා වනස්පතියක් බවට පත්ව ඇත්තේද එයයි. ජාතික හා ජාත්‍යන්තර විරෝධය හමුවේ එය හකුළා ගන්නා බවට හඟවමින්, මේ කාලකණ්නි පාලකයින් වෙනත් වේශයකින්, නමකින් ගෙනෙන්නට කැස කවන්නේ ප්‍රති ත්‍රස්ත පනත (ATA) නමිනි. රටේ බහුතරය තවමත් එදා 78 දී මෙන්ම සීතල වී ගල් ගැසී සිටී.

සියලු මානව හිමිකම් උල්ලංඝනය කරන මේ පනත දැනට ගැසට් කර ඇති ආකාරයෙන් ම සම්මත වුවහොත් අනිවාර්යයෙන්ම මිනිස් අයිතිවාසිකම් දංගෙඩියට යන බව අමුතුවෙන් කිවයුතු නොවේ. එදත් අදත් අපේ විරෝධය වැඩි වැඩියෙන් වර්ධනය වූවා මිස, අබමල් රේණුවකින් වත් අඩුවී නොමැත. වෘත්තීය සමිති පවත්වා ගැනීමට ඇති අයිතිය ට පවා තර්ජනයක් එල්ල වී තිබේ.

අධිකරණයේදී හෝ පාර්ලිමේන්තුවේ දී පරාජය කරගත නොහිනි නම් අපේ වල අප' තින්ම කපාගන්නට සිදුවෙනුවා නොඅනුමානය. ඒ සියල්ලට ඉහළින් ඉන්ද්‍රඛීලයක් සේ නැඟී සිටිනා ජනතා බලය පිළිබඳව විශ්වාසය තබමු..

පෙළගැසෙමු මේ දැන්ම..

**'අසනි' ඒ වෙනුවෙන් සිය ශක්තිය කැප කරන්නීය.**

## ගෝලීය ධනවාදයේ කුරිරු ශ්‍රම සූරා කෑමට එරෙහිව

# කම්කරු පංතියේ ඉරණම



මෙවර අපේ මැයි දින රැස්වීම සම්ප්‍රධායික මුහුණුවරින් වෙනස් වී පැවැත්වීමට තීරණය කරනු ලැබීය. මෙලෙස සාම්ප්‍රධායික මුහුණුවරින් වෙනස් වු මැයි දින කථිකාවතක් පැවැත්වීමට තීරණය කරනු ලැබුවේ ඉතිහාසයේ අප පසුකරමින් තිබෙන සමාජ පසුබිම අතිශයින්ම සංකීර්ණ මුහුණුවරක් ගනිමින් සිටින නිසාය. මෙම තත්වය මතුවීමට මුලික වශයෙන් හේතු වුයේ වාමාංශික නාමයෙන් පෙනීසිටි නායකයින් සහ පක්ෂ කරනු ලැබු පාවාදීම නිසා ඇති කරනු ලැබු දේශපාලන මතවාදී ව්‍යාකූලත්වයයි. අපි නිරන්තර සාකච්ඡාවට බඳුන්කරන 1989 නැගෙනහිර යුරෝපයේ සමාජවාදී නාමයෙන් තිබු විකෘති කම්කරු රාජ්‍ය බිඳ වැටීම සහ 1991 දෙසැම්බරයේ දී සොවියට් සංගමය විසුරුවා හැරීම මගින් ඇතිකරනු ලැබු දැවැන්ත සමාජ බලපෑම මෙයට හේතුවු බව පෙනේ. මෙම රාජ්‍ය පද්ධතිය බිඳවැටීමෙන් පසු ඉතිහාසයේ සමාප්තිය යන නමින් NATIONAL INTEREST සඟරාවට තම ෆ්‍රැන්සිස් ෆුකුයාමා විසින් කරනු ලැබු ප්‍රකාශයද ධනපති චින්තකයන්ගේ විවිධ ප්‍රකාශ මගින්ද ධනේශ්වර මතවාදයට තාවකාලික පිළිසරණක් ලැබුණු බව දකින්නට ලැබුණත් එයට කිසිඳු විද්‍යාත්මක පදනමක් නොමැති බවට ධනේෂ්වර සමාජ ක්‍රමය විසින් නිර්මාණය කර තිබෙන ගැඹුරු සමාජ අසමාන තාවයෙන් හා ඉන් ජනනය කෙරෙන අසහනයෙන් විද්‍යාමාන වෙමින් තිබේ.

පන්ති සහිත සමාජය පවතින තෙක් පන්ති අරගලය පවතින බව ඉතිහාසය විසින් සනාථ කර තිබෙන තත්වයක් තුළ වුවත් වැටුප් සඳහා ශ්‍රමය වැය කරන පන්තිය කම්කරු පන්තිය බවට කරණු ලැබු අර්ථ කථනය වැරදියැයි සමහර ලිබරල් වාදීන් තර්ක ඉදිරිපත් කරන්නට පටන් ගෙන තිබේ. මේ අතර ධනේශ්වර නව තාක්ෂණය හමුවේ කම්කරු ශ්‍රම බලකාය අඩුකිරීමට ප්‍රාග්ධන හිමි පන්තිය කටයුතු කරමින් තිබෙන නිසා පන්ති අරගලය නිශේදවී යනු ඇතැයි පෙන්වා දිමට ද පටන් ගෙන තිබේ. කම්කරු පන්ති අතර සමහර දෙනා තමන් කම්කරුවන් ලෙස හඳුන්වා දීමට විරුද්ධ වෙමින් තිබෙන බවට දකින්නට ලැබේ. මෙවන් සමාජ පසුතලයක් තුළ සාම්ප්‍රධයික වෘත්තීය සමිති නායකයින් ධනේශ්වර පාලකයින්ගේ ඒජන්තයින් බවට පත්වී ඇති නිසා වෘත්තීය සමිතිවලට සම්බන්ධ වන පිරිස අඩුවෙමින් තිබෙන බව පෙනේ. තවත් සමහර වෘත්තීය සමිති නායකයින් ජනතාවගේ සුභ සාධන අයිතීන් කප්පාදු කිරීමට පාලකයින්ට සහයෝගය ලබා දෙමින් ඇත. ඉතිහාසයේ කම්කරු පන්තිය සටන්කර දිනාගත් අයිතීන් ගැන නවක කම්කරු පන්තියට අත්දැකීමක් නොමැත. ඔවුන් පන්ති අරගලයේ ඉතිහාසය හදාරා නැත. මොවුන් සමඟ කථිකාවතකට මුලපිරීමටවත් වෘත්තීය සමිති නායකයින් ක්‍රියා කරන්නේ නැත. මේ නිසාම වෘත්තීය සමිති ගැන කම්කරුවන් අතර විශ්වාසය බිඳවැටීමේ ස්වභාවයක් දක්නට ලැබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස පන්ති අරගලයට නායකත්වය ලබා දීමේ අවස්ථාව ගිලිහි යමින් තිබෙන බව පෙනේ. මේ මතුවන සමාජ වර්ධනයන් ගැඹුරින් විග්‍රහ කරගනිමින් අනාගතයේ දිග හැරෙන පන්ති අරගලයට නායකත්වය ලබාදීම සඳහා කම්කරු පන්තියට පක්ෂයක් ගොඩනැගීම සඳහා අපි වහාම යොමුවිය යුතුව තිබේ. මේ සඳහා තිබෙන අභියෝග කථිකාවතකට ලක් කිරීමට මෙවර මැයි දිනය යොදා ගැනීමට අපි තීරණය කළෙමු.■

**නයාට අඳු කොළ මෙන්..** 4 පිටුවෙන්

සේවාදායකයෙකු වෙනුවෙන් පෙනී සිටින බවට සෑම නීතිඥවරයෙක් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ දිවුරුම් දි තිබේ.

ජනාධිපති නීතිඥ පීරිස් චින්තකගේ පියාගේ ඉල්ලීම මත චින්තකට ජිවත්වීමට ඇති අයිතිය වෙනුවෙන් පමනක් පෙනි සිටියේය. සලිදු වෙනුවෙන් පෙනි සිටින්නේ ප්‍රසිද්ධ ජනාධිපති නීතිඥවරයෙකු වන නලීන් ලද්දුවහෙට්ටිය. ඔහු නීතිඥ සංගමයේ සභාපති නොවන නිසාත් අරගලකරුවන් වෙනුවෙන් පෙනි නොසිටිනිසාත් ලද්දුවහෙට්ටි මත්ද්‍රව්‍ය මාෆියාවට සම්බන්ධ යැයි ආණ්ඩුව හෝ ආණ්ඩුවේ ගොබෙල්ස්ලා කියන්නේ නැත.

ජනාධිපති පිරිස් චින්තක වෙනුවෙන් මුලික අයිතිවාසිකම් පෙත්සම ගොනු කිරීමට පමනක් රුපියල් 75.000 මුදලක් අය කරන බවත් සැකරුවෙකු වෙනුවෙන් අපරාධ පරික්ෂණ දෙපාර්මේන්තුව හමුවේ පෙනී සිටීමට පමනක් රුපියල් 10.000 මුදලක් අය කරන බවත් නීතිඥ සංගමය මත්ද්‍රව්‍ය මාෆියාව සම්පව කටයුතු කරන බව හිටපු ගුවන් හමුදා බුද්ධි අංශ නිලධාරියෙකු මෙන්ම ගවේෂණාත්මක මාධ්‍යවේදියෙකු යැයි කියා ගන්නා කීරති රත්නායක නැමැත්තෙක් යුටියුබ් නාලිකාවක් සමග පැවැති සම්මුඛ සාකච්ජාවකදී නීතිඥ සංගමයට සහ සභාපති ජනාධිපති නීතිඥ පීරිස්ට චෝදනා කර ඇත.

රත්නායක නැමැත්තා අපරාධ පරික්ෂණ දෙපාර්මේන්තුව මගින් අත්අඩංගුවට ගෙන ලැප්ටොප් පෙන්නට යැයි රාත්‍රියේ රැගෙන ගොස් මරා දමන්නට කැසකවද්දී ,මුදල් නොගෙන ඔහුව බේරා ගෙන ගත්තේ ජනාධිපති නීතිඥ පීරිස් බව රත්නායක එම සම්මුඛ සාකච්ජාවේදී පාපෝච්චාරණය කරයි .

රත්නායක නැමැත්තා විසින් තමාට එරෙහිව සිදු කරන ප්‍රකාශ අසත්‍ය බව යුටියුබ් නාලිකාවකට සම්මුඛ සාකච්ජාවක් දෙමින් ප්‍රකාශ කළ ජනාධිපති නීතිඥ පීරිස් තම සේවාදායකයන්ගෙන් ඔය කියන තරම් විශාල ගාස්තු අය කර නැති බවත් අපරාධ පරික්ෂණ දෙපාර්මේන්තුවේ රදවා සිටින සැකකරුවන් බැලිමට කිසිදු දවසක එහි ගොස් නැති බවත් එම සම්මුඛ සාකච්ජාවේදී අවධාරණය කරයි. ජේ.ආර් . ජයවර්ධන 1977 බලයට පැමිණෙන්නේ නව ලිබරල් ධනපති ක්‍රමය කරපින්නාගෙනය . නව ලිබරල් ක්‍රමය ක්‍රියාත්මක කිරීමට යැමේ දී කම්කරු *පිඩිත මහජනයා තුලින් පැනනගින විරෝධය මැඩලීමටත් 71 මෙන් දකුණේ සහ උතුරේ පැනනගින ඕනැම තත්තවයකට මුහුණදීම සදහා ජේ .ආර් .ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඇතුළු මර්දන අණ පනත් කලින් ගෙනැවිත් තිබුණි .

අද ජනාධිපති වික්‍රමසිංහ ද ජේ. ආර් අනුවයමින් නව මර්දන අණ පනත් හදුන්වාදෙමින් ධනපති ක්‍රමයේ නොහැකියාව වාසා ගන්නට වික්‍රමසිංහ වියරු උත්සහයක නිරත වෙමින් ඇත.ජේ.ආර් තමන්ගේ නියෝග ක්‍රියාත්මක නොකලා යැයි එවකට හිටපු අගවිනිසුරු නෙවිල් සමරකොන්ගේ ගෙදරට කලු ලකී ලව්වා ගල් ගැස්ස විණි. ඒතැනින් නොනැවතුණු ජේ.ආර්. ධර්මිෂ්ට සමාජයක් ගොඩනගන බව පවසා ජේ. ආර් .මැරයෝ ලව්වා එදිරවිර සරත්චන්ද්‍ර ඇතුළු කාලාකාරුවන්ට කානු වල දමාගෙන පහරදුන්හ. ජේ.ආර්. එදා කලු ලකී යොදාගෙන අගවිනිසුරුගේ ගෙදරට ගල් ගැස්සුවා සේ අද ජනාධිපති වික්‍රමසිංහ නියොජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකොන් සහ මහජන ආරක්ෂක ඇමති යොදවා ජනාධිපති නීතිඥ පීරිසිගේ කාර්යාලය ඉදිරිපිට විරෝධතා උද්ඝෝෂණ සංවිධානය කරති. කුණු වී ඔජස් ගලන ධනපතී ක්‍රමය ඇතුලේ ප්‍රජාතන්ත්‍රවාදය සෙවීම හරියට එළුවාගේ ඇට දෙක වැටෙනකම් උෟගේ පස්සේ බඩ ගෑමට සමානය .

ධනවාදී අර්බුදයට ඇති එකම විසදුම සමාජවාදය පමණි . සමාජවාදී පිළවෙතින් බැහැර වන සැම පිළිවෙතක් ම සේවය කරන්නේ ධනපති ක්‍රමය රැකීමටයි. කම්කරු පන්තිය ස්වාධීන බලමුළු ගැන්වීමෙන් මෙපිට ධනපති ක්‍රමය මුලින් උදුරා දැමීය නොහැකිය .මානව ඉතිහාසයේ අර්බුදය විප්ලවවාදී නායකත්වය පිළිබද අර්බුදයයි. 2022 මැයි 09 සහ ජුලි 09 ය නැගිටීම් වල පරාජයන්ට හේතුව විද්‍යාත්මක ඉදිරි දර්ශනයක් සහිත විප්ලවවාදී ව්‍යාපාරයක් නොමැතිකමය. අද ප්‍රධාන කටයුත්ත වන්න. විප්ලවාදී පක්ෂය ගොඩනැගිමයි . විප්ලවවාදී නායකත්වය පිළිබද ප්‍රශ්නය ඉදිරියේදී විසදා ගැනීමට නොහැකි වුවහොත් පැනනගින අරගල පරාජයන්ගෙන් කෙරවල වීමට නියමිතය.■

ඇහැළියගොඩ, අඟරුවාමුල්ල, පදිංචි දේව මහින්දදාස වන මා විසින් ඇහැළියගොඩ, මිහිඳු ග්‍රැෆික්ස් ආයතනයේ මුද්‍රණය කරන ලදි.